**ශීර්ෂය 120 - කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**
**----------------------------------------------------------------------------------------------------------------**

ශීර්ෂය 120 - කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 අගෝස්තු 23 දින කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

**-----------------------------------------------------------------------------------------------**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

**-------**

### 2.1 විසර්ජන ගිණුම

**-----------------**

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

**---------------------------**

අමාත්‍යාංශය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 9,901.60 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 7,468.09 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 2,433.51 ක් හෙවත් සියයට 24.58 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 8,808.88 | 6,932.73 | 1,876.15 | 21.30 |
| මුලධන | 1,092.72 | 535.36 | 557.36 | 51.01 |
| **එකතුව** | **9,901.60** | **7,468.09** | **2,433.51** | **24.58** |

## 2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාළ විෂය අංක 12001 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 30.00 | 24.70 | 18.00 | 19.64 | 85.00 | 65.68 |

## 2.3 විගණන නිරීක්ෂණය

කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3.** **ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1** **විසර්ජන ගිණුම**

**3.1.1** **අයවැය විචලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** වැය විෂයයන් 15 ක් සඳහා සලසා තිබුණු රු. 97,667,500 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි.

**(ආ)** වැය විෂයයන් 21 කට අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 50 ක සිට සියයට 99 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**3.2** **අග්‍රිම ගිණුම්**

2015 ජුලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371(5) ප්‍රකාරව ලබා දී තිබුණු තත්කාර්ය අතුරු අග්‍රිම කාර්යය නිම කර දින 10 ක් ඇතුළත නිරවුල් කළ යුතු වුවත්, අවස්ථා 38 කදී ලබා දුන් එකතුව රු.804,293 ක් වූ තත්කාර්ය අතුරු අග්‍රිමයන් පියවීම සඳහා, කාර්යයන් නිම වී දින 20 ක සිට මාස 10 ක් දක්වා කාල පරාසයක් ගෙන තිබුණි.

**3.3** **යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**3.3.1** **වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කර භාණ්ඩ හා සේවා ලබා ගැනීම සඳහා අයවැය ඇස්තමේන්තුවෙන් රු. මිලියන 18 ක ප්‍රතිපාදන සලසා තිබුණි. එම ප්‍රතිපාදන උපයෝජනය කිරීම සඳහා 2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව මිලදී ගැනීම් සිදු කරනු ලබන කාල වකවානු සඳහන් කර සවිස්තරාත්මකව ප්‍රසම්පාදන කාලසටහනක් පිළියෙල කර නොතිබුණි.

**3.3.2** **අභ්‍යන්තර විගණනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආයතනයේ පැවැත්මට බලපාන්නා වූ නීතිමය රාමුව තුළ කාර්යක්ෂම අභ්‍යන්තර පාලන ව්‍යුවහයක් ස්ථාපිත කර ගැනීමටත්, අරමුණුගතව සමස්ථ කාර්යයේම කාර්යසාධනයක් ඇති කර ගැනීම කළමනාකරණයේ ප්‍රධාන වගකීම වන අතර, ඒ සඳහා සහයවීමට අවශ්‍ය ක්‍රමවේදයක් සකස් කර එම කාර්යභාරය අභ්‍යන්තර විගණනයට යටත් කළ යුතු වුවත්, කළමනාකරණය විසින් ඒ පිළිබඳ අවධානය යොමුකර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී අභ්‍යන්තර විගණන අංශය විසින් විගණන වාර්තා 30 ක් නිකුත් කර තිබුණි. එම විගණන වාර්තාවලින් පෙන්වා දුන් අඩුපාඩු නිවැරදි කර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කළමනාකරනය විසින් ප්‍රමාණවත් පරිදි කටයුතු කර නොතිබුණි.

**3.4** **කාර්යසාධනය**

-----------------

2016 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ)** **ප්‍රධාන අරමුණු ඉටු කර නොගැනීම**

-----------------------------------

ළමා හා කාන්තා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා යහපාලන භාවිතාවන් තහවුරු වන පරිදි අදාළ අවශ්‍යතා සම්පාදනය කිරීම සහ ප්‍රතිපත්ති සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම හා නියාමනය කිරීම අමාත්‍යාංශයේ මෙහෙවර වුවද, ළමා හා කාන්තා අයිතිවාසිකම් තහවුරු කිරීම, ආරක්ෂා කිරීම, ප්‍රවර්ධනය කිරීම සඳහා සම්පාදනය කළ නීති හා සකස් කළ ප්‍රතිපත්ති බලාත්මක කර ක්‍රියාත්මක කිරීම සිදුකර නොතිබුණි.

**(ආ)** **ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්**

-----------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) පෙර පාසල් ගුරුවරුන් 10,000 කට මාසයකට රු. 250 බැගින් දීමනාවක් ලබා දීම සඳහා රු. මිලියන 30 ක ප්‍රතිපාදන සලසා ගෙන තිබූ නමුත්, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් දීමනාව ලබා දිය යුතු ගුරුවරියන් හඳුනා ගැනීමට නොහැකි වීම නිසා පෙර පාසල් ගුරුවරියන් 4,100 කට පමණක් රු. මිලියන 11.68 ක දීමනාවක් ගෙවා තිබුණි.

(ii) අසරණභාවයට පත් කාන්තාවන් හා දරුවන් සඳහා සුභසාධන හා පුනරුත්ථාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා රැකවරණය ලබා දීම අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයක් වුවද, 2016 හා 2017 මුල් මාස තුන තුළ පුවත්පත්වලින් පමණක් වාර්තා වූ ළමයින් හා කාන්තාවන් මුහුණු දී තිබූ කාන්තා හිංසන හා ළමා අපයෝජන සිද්ධීන් සංඛ්‍යාව 1,251 ක් පමණ විය. එම සිද්ධීන් සම්බන්ධයෙන් අමාත්‍යාංශය කිසිදු මැදිහත් වීමක් සිදුකර නොතිබුණි.

(iii) ළමා ආරක්ෂාව හා හිමිකම් තහවුරු කිරීමේ වැඩසටහන් පැවැත්වීම සඳහා රු.මිලියන 67 ක ප්‍රතිපාදන සලසා තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් රු.මිලියන 47.61 ක් දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත ලබා දී තිබුණි. එසේ ලබා දී තිබුණු ප්‍රතිපාදන පිළිබඳව නිසි අධීක්ෂණයක් අමාත්‍යාංශය විසින් සිදු නොකිරීම හේතුවෙන් එම ප්‍රතිපාදනවලින් එකතුව රු.මිලියන 29.13 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉතිරි කර තිබුණි.

(iv) ජාතික කාන්තා කමිටුව විසින් ළමා අපයෝජනය හා කාන්තා හිංසනය වැලැක්වීම යටතේ 2015 වර්ෂයේදී රු.මිලියන 3.8 ප්‍රතිපාදන සලසා තිබුණි. එම ප්‍රතිපාදනවලින් ළමා මව්වරුන්ගේ පර්යේෂණය, සයිබර් තාක්ෂණය හා කාන්තා හිංසනය, වතුකරයේ කාන්තාවන්ට සිදුවන හිංසනය පිළිබඳ පර්යේෂණ 3 ක් සිදු කිරීම සඳහා 2015 වර්ෂයේදී රු.මිලියන 2.92 ක්ද, 2016 වර්ෂයේදී රු.මිලියන 0.72 ක් ද වැය කර තිබුණි. මේ පිළිබඳ වාර්තා 2016 මැයි මාසයේදී ලැබී තිබූ නමුත්, එහි නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වැඩසටහන් සැලැසුම් කර ඇති බව දක්වා තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එයක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) **සුභසාධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම**

-----------------------------------------

ගැබිණි මව්වරුන්ට පෝෂණ මල්ල වැඩසටහන සඳහා රු.මිලියන 7,500 ක් ද, කිරි විදුරුව වැඩසටහන සඳහා පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් මඟින් රු.මිලියන 127.9 ක්ද වශයෙන් සුභසාධන වැය විෂය සඳහා රු.මිලියන 7,627.9 ක ප්‍රතිපාදන අමාත්‍යාංශය වෙත සලසා දී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) **ගැබිණි මව්වරුන්ට පෝෂණ මල්ලක් ලබාදීමේ වැඩසටහන**

-----------------------------------------------------------------

ගර්භණී මව්වරුන් සඳහා පෝෂණ දීමනාව ලබාදීමේ වැඩසටහන සඳහා රු.මිලියන 7,500 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර, 2016 දෙසැම්බර් 31 දින වන විට විසර්ජන ගිණුම අනුව ඉන් රු.මිලියන 5,746 ක් වැය කර තිබුණි. එහෙත් එදිනට එක් එක් ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ඒ වෙනුවෙන් සිදු කර තිබුණු වියදම ලෙස අමාත්‍යාංශය විසින් තහවුරු කරගත් වියදම රු.මිලියන 4,354 ක් වී තිබුණි. ඒ අනුව රු.මිලියන 1,392 ක වෙනසක් අනාවරණය වූ අතර, එම වෙනස 2017 ජුනි 05 දින වන විටත් හඳුනා ගෙන නොතිබුණි.

(ii) **කිරි විදුරුව වැඩසටහන**

-------------------------

කිරි විදුරුව වැඩසටහන සඳහා පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් මගින් රු.මිලියන 127.9 ක ප්‍රතිපාදන සලසා තිබුණත්, ඉන් රු.මිලියන 106.43 ක් පමණක් වැය කර තිබුණි. වයස අවුරුදු 2 ක සිට අවුරුදු 5 ක් දක්වා වයස් කාණ්ඩයේ දරුවන්ගේ පෝෂණ මට්ටම ඉහළ නැංවීමට පෝෂ්‍යදායි වැඩිහිටි ආහාරවලට ප්‍රමුඛත්වය ලබා දිය යුතු බව සහ කිරි මිලි ලීටර් 100 ක මිලි ග්‍රෑම් 87.5 ක් ජලය අන්තර්ගත බව මාතෘ හා ළමා සෞඛ්‍ය අධ්‍යක්ෂක විසින් පෙන්වා දී තිබුණි. තවද, මෙම වැඩසටහනින් අපේක්ෂිත පෝෂණ මට්ටමේ ඉහළ නැංවීමක් සිදු නොවුවද 2016 වර්ෂයේ දීද මෙම වැඩසටහන ක්‍රියාත්මක කර තිබුණි.

(ඈ) **කාන්තා රැකවරණ මධ්‍යස්ථාන**

--------------------------------

කාන්තාවන්ට එරෙහි ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වාර්තාවට අනුව ශ්‍රී ලාංකික කාන්තාවන්ගෙන් සියයට 60 කට වඩා ගෘහස්ථ හිංසනයට ලක් වේ. මෙම තත්ත්වය වළක්වාලීමට ගෘහස්ථ හිංසනය වැළැක්වීමේ පනත නීතිගත කර වින්දිතයින් හඳුනා ගෙන රැකවරණය ලබා දීමටත්, වෙළඳාමට ගොදුරු වූ කාන්තා හා ළමා වින්දිතයන්ට රැකවරණය ලබා දීම අරමුණු කරගෙන මෙම මධ්‍යස්ථාන පිහිටුවා තිබුණි. පුවත්පත් මඟින් කාන්තා හිංසනය හා ළමා අපචාර 1251 ක් වාර්තා වී තිබුණ ද, රත්මලාන රැකවරණ මධ්‍යස්ථානයෙන් සමාලෝචිත වර්ෂයේ වින්දිතයන් 15 දෙනෙකුට පමණක් රැකවරණය ලබා දී තිබුණි. මීරිගම රැකවරණ මධ්‍යස්ථානයේ කිසිදු වින්දිතයකු නොමැති අතර, ආරක්ෂක නිලධාරින් 2 දෙනෙකුට රු.515,100 ක් වැටුප් ලෙස සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි. තවද, 2015 වර්ෂයේදී රත්නපුර දිස්ත්‍රික්කයෙන් රු.මිලියන 10.57 වැය කර ඉදිකළ රැකවරණ මධ්‍යස්ථානය 2017 ජුලි 31 දින වන විටත් භාවිතා කර නොතිබූ අතර, මහනුවර කාන්තා රැකවරණ මධ්‍යස්ථානයක් ඉදිකිරීමට රු.මිලියන 10 ක් 2015 ජුලි 17 දින ප්‍රාදේශීය ලේකම් වෙත යවා තිබූ නමුත්, එම ඉදිකිරීම් නතර වීමත් සමඟ එම ප්‍රතිපාදන අහෝසි වූ බව ප්‍රකාශ වී තිබුණි. තවද, මෙම මධ්‍යස්ථානවල අඩුපාඩු සහ ප්‍රගතිය සමාලෝචනය අධිකරණ අමාත්‍යාංශය සහ මෙම අමාත්‍යාංශයේ සහභාගිත්වයෙන්

සිදුකරනු ලබන බව සඳහන් කර තිබුණද, රැකවරණය අවශ්‍ය වින්දිතයන් විශාල පිරිසක් රැකවරණයක් නොමැතිව රටේ සිටියදී රැකවරණ මධ්‍යස්ථාන මෙසේ හිස්ව පැවති බව නිරීක්ෂණය විය.

**(ඉ) චක්‍රීය ණය වැඩසටහන**

-------------------------

ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය මගින් 1990 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා රු.මිලියන 93 ක් ලබා දෙමින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 304 ක ක්‍රියාත්මක කර තිබූ චක්‍රීය ණය වැඩසටහන සම්බන්ධයෙන් කොට්ඨාශ 274 ක විස්තර පමණක් විගණනයට ලබා දී තිබුණි. ඒ අනුව එම කොට්ඨාශවලට රු. මිලියන 85.46 ක් ලබා දී තිබූ අතර, 2016 දෙසැම්බර් 31 දිනට එම බැංකු ගිණුම්වල ඉන් රු. මිලියන 50.5 ක ශේෂයක් තිබුණි. ඒ අනුව මෙම වැඩසටහන චක්‍රිය ණය වැඩසටහනක් ලෙස ක්‍රියාත්මක වී නොතිබුණු බව නිරීක්ෂණය විය. තවද, එදිනට අයවිය යුතු ණය ශේෂයන්ගේ එකතුව රු. මිලියන 34.95 ක් වුවද, පැවති ණය ශේෂයන්ගේ එකතුව රු.මිලියන 24 ක් එම ශේෂ දෙක අතර රු.මිලියන 10.8 ක පැහැදිලි නොකළ වෙනසක් නිරීක්ෂණය විය.

## 3.5 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

---------------------------------

ගොඩනැගිලි ඉදිකිරීම සඳහා 120-01-01-2104 යටතේ ප්‍රතිපාදන සලසා ගෙන නොතිබුණි. නමුත් අමාත්‍යවරයාගේ නිල නිවසේ තාප්පය ඉදිකිරීම සඳහා රු.3,700,000 ක වියදමක් කර තිබුණත්, එම වියදම පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් මගින් 120-01-01-2102 වැය විෂය යටතේ අමාත්‍යවරයාගේ නිල නිවසට ලීබඩු හා උපකරණ මිලදී ගැනීම සඳහා ලබා ගෙන තිබුණු රු.10,143,000 ක ප්‍රතිපාදනයෙන් සිදු කර තිබුණි. ඒ අනුව පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් මගින් ප්‍රතිපාදන ලබාදීමේදී ඇතුළත් කර තිබුණු කොන්දේසිවලට පටහැනිව එම වියදම සිදු කර තිබුණු බව නිරීක්ෂණය විය. තවද වත්කම් සංචලන වාර්තාවේ එම වියදම ගොඩනැගිලි ඉදිකිරීම් ලෙස නොව ලීබඩු හා උපකරණ මිලදී ගැනීමක් ලෙස දක්වා තිබුණි.

## 3.6 කළමනාකරණ දුර්වලතා

---------------------------

දේශපාලන ක්ෂේත්‍රයේ කාන්තා නියෝජනය ප්‍රවර්ධනය කිරීම සඳහා සය මාසික සහතිකපත් පාඨමාලාවක් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂි විද්‍යා අංශය යටතේ පවත්වා තිබූ අතර, ඒ සඳහා එක් අයෙකුට රු.16,750 ක් බැගින් සිසුන් 40 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දී රු.670,000 ක් වැය කර තිබුණි. එම පාඨමාලාව සඳහා සිසුන් 73 දෙනෙකු බඳවා ගෙන තිබූ නමුත්, දේශන කාලය පැය 114 කින් පැය 76 කට වඩා අඩු කාලයක් සහභාගි වූ සිසුන් 39 ක් වූ අතර, 17 දෙනෙකු කිසිදු දේශනයකට සහභාගි වී නොතිබුණි. සිසුන් 32 ක් පමණක් සහතික පත් ලබා ගෙන තිබුණි. මෙවැනි පාඨමාලා 04 ක් පසුගිය වර්ෂවලදීද රු.මිලියන 6 ක් වැය කර සිසුන් 179 ක් සඳහා පවත්වා තිබුණ ද, සිසුන් 109 ක් පමණක් පාඨමාලාවන් සම්පූර්ණ කර තිබුණි. එහෙත් ඔවුන්ගෙන් කොපමණ සංඛ්‍යාවක් දේශපාලනයට අවතීර්ණව කටයුතුවල නියලීම පිළිබඳව පසු විපරම් කිරීමක් අමාත්‍යාංශය විසින් සිදු කර නොතිබුණි.

## 3.7 ළමා සංවර්ධන අරමුදල

ශ්‍රී ලංකාවේ පැවැති යුධ වාතාවරණය හා වෙනත් ස්වභාවික ආපදාවන් නිසා තම දෙමාපියන් හෝ භාරකරුවන් අහිමි වූ දරුවන්ට මෙන්ම ආර්ථික දුෂ්කරතා නිසා තමන්ගේ අධ්‍යාපන කටයුතු අඛණ්ඩව ගෙන යාමට හා සහජ කුසලතා හා වෙනත් දක්ෂතා වර්ධනය කර ගැනීමට නොහැකි වූ ශ්‍රී ලාංකික දරුවන්ට මූල්‍ය ආධාර ලබා දීම පෙරදැරි කර ගෙන ළමා සංවර්ධන අරමුදල ස්ථාපිත කර තිබුණි. යෝජිත වැඩසටහන් වඩාත් ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු බව 2014 ජනවාරි 24 දිනැති අංක අමප/13/1436/528/008-1 දරන අමාත්‍ය මණ්ඩල තීරණයේ සඳහන් කර තිබුණු අතර, 2017 ජූලි 26 දිනැති අංක PFD/SOP/WMCA/001/FD/03 දරන රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපියෙන් ද සියලුම අරමුදල් සමාලෝචනය කර සැකසූ වාර්තාව ආර්ථික කළමනාකරණ පිළිබඳ අමාත්‍ය මණ්ඩල කමිටුවේ (CCEN) හා අමාත්‍ය මණ්ඩල අනුමැතියට යොමු කර තිබුණු බව සඳහන් කර තිබුණි. කෙසේ වෙතත් ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේ දී කොඩි අලෙවියෙන් හා ස්ථාවර තැන්පතු පොලි වශයෙන් ලැබී තිබූ පිළිවෙලින් රු.1,987,856 ක් හා රු.1,996,765 ක් ළමුන්ට ආධාර කිරීම සඳහා යොදා ගෙන නොතිබුණි.

තවද, උක්ත අමාත්‍ය මණ්ඩල සංදේශයෙන් ළමා රැකවරණය සම්බන්ධ පරමාර්ථ සාක්ෂාත් වන අයුරින් වැඩසටහන් සකස් කිරීමේදී විශේෂයෙන් ළමා අපචාරවලට ලක් වූ දරුවන්, විදේශ රැකියාවල නියුතු දෙමාපියන්ගේ දරුවන් හා විශේෂ අවශ්‍යතා ඇති දරුවන් කෙරෙහි වැඩි අවධානයක් යොමු කර වාර්ෂික ක්‍රියාකාරි සැලැසුම් පිළියෙල කර ඒ සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු එම ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමට එකඟතාවය පල කර තිබුණි. කෙසේ වුවද ඒ සඳහා ළමා රැකවරණ ආයතනයෙන් (save the children) ප්‍රදානය කර තිබූ බ්‍රිතාන්‍ය පවුම් 1,494,000 ක් අමාත්‍යාංශය වෙත ලබා දී නොතිබුණි.

## 3.8 මුල් ළමාවිය සංවර්ධන ව්‍යාපෘතිය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** ඇමෙරිකානු ඩොලර් මිලියන 50 ක ලෝක බැංකු ණය ආධාර යටතේ ආරම්භ කර තිබූ මුල් ළමාවිය සංවර්ධනය කිරීමේ වැඩසටහන සඳහා රු.මිලියන 473 ක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණද, ඊට අදාළ වැඩසටහන් සැලැසුම් කළ පරිදි ක්‍රියාත්මක කිරීමට ප්‍රමාණවත් පරිදි කටයුතු කර නොතිබීම නිසා 2016 දෙසැම්බර් 31 දින වන විටත් ඉන් රු. මිලියන 357 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

**(ආ)** වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මට අනුව රු.මිලියන 14.5 ක ප්‍රතිපාදන සලසා තිබුණු ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබන මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සංගණනය පදනම් කර ගනිමින් ව්‍යාපෘතියේ කාර්යයන් සිදු කිරීමට සැලැසුම් කර තිබූ නමුත් එම වාර්තාව 2017 ජූලි මාසය වන විටත් ලබා ගෙන නොතිබුණි. කෙසේ වුවද, ඒ සඳහා රු.මිලියන 5.96 ක් වැය කර තිබුණි.

**(ඇ)** වතු අංශයේ මුල් ළමාවිය සංවර්ධන කටයුතු සඳහා වැවිලි මානව සංවර්ධන භාරය (PHDT) සමඟ ගිවිසුමකට එළඹ තිබූ අතර, කළාප 7 කට (කෑගල්ල, බදුල්ල, මහනුවර, නුවරඑළිය, හැටන්, රත්නපුර සහ ගාල්ල) අයත් වතුවල එක් කලාපයක 4 බැගින් මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන

28 ක් ඉදිකිරීම සඳහා රු.මිලියන 112 ක ප්‍රතිපාදන සලසා තිබුණද, 2016 දෙසැම්බර් 31 දින වන විටත් ඒවායේ ඉදිකිරීම් කටයුතු අවසන් කර නොතිබුණි. තවද, වැවිලි මානව සංවර්ධන භාරය යටතේ සිදු කරනු ලබන මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන අලුත්වැඩියා කිරීම් 35 කින් 13 ක් ද, සෙල්ලම් මිදුල් ඉදිකිරීම් හා අලුත්වැඩියා කොන්ත්‍රාත් 77 කින් 46 ක් ද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිම කර නොතිබුණි.

## 3.9 ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත සිදුවන හිංසනය වැලැක්වීම පිළිබඳ වැඩසටහන

එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන මඟින් මෙම වැඩසටහනට ඇමරිකානු ඩොලර් මිලියන 1.8 ක් ලබා දී තිබුණි. 2014, 2015 හා 2016 යන වර්ෂවල දී ඉන් රු.මිලියන 78 පමණ වැය කර තිබුණ අතර, එයින් ද රු.මිලියන 38.36 ක් ළමා කටයුතු, ආපදා හා කළමණාකරන, ආර්ථික සංවර්ධන, අධ්‍යාපන, විදේශ, සෞඛ්‍ය, අධිකරණ, මාධ්‍ය සහ බලගැන්වීම් හා නිවාරණ යන අංශ 9 ඒකාබද්ධ කර ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කිරීම වෙනුවෙන් වැය කර තිබුණි. එම ජාතික ක්‍රියාකාරි සැලැස්ම 2016-2020 කාල පරිච්ඡේදය තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කර තිබුණි. මෙම ව්‍යාපෘතියේ ක්‍රියාකාරි සැලැස්මේ සඳහන් ක්‍රියාකාරකම් 12 ක් ක්‍රියාත්මක කිරීම සඳහා රු.මිලියන 9.08 ක ප්‍රතිපාදන සලසා තිබුණද, එය උපයෝජනය කර එම ක්‍රියාකාරකම් සිදුකර නොතිබුණි. එමෙන්ම ක්‍රියාකාරකම් 9 ක් සඳහා සලසා තිබුණු රු.මිලියන 6.12 ක ප්‍රතිපාදනයෙන් රු.මිලියන 1.72 ක් වැය කර තිබුණ ද, සැලැසුම් කළ එම ක්‍රියාකාරකම්වලින් සියයට 38 ක සිට සියයට 91 ක් දක්වා ප්‍රමාණයක් ඉටු කර නොතිබුණි.

## 3.10 මානව සම්පත් කළමනාකරණය

### අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 31 | 27 | 04 |
| (ii) | තෘතියික මට්ටම | 17 | 13 | 04 |
| (iii) | ද්විතියික මට්ටම | 1,438 | 1,142 | 296 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 86 | 66 | 20 |
| | **එකතුව** | **1,572** | **1,248** | **324** |

මේ පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත කරනු ලබන වනිතා සංවර්ධන නිලධාරීන් හා උපදේශන සහකාර නිලධාරී පුරප්පාඩු 296 ක් ලෙස සඳහන් කර තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සේවයේ නියුතු නිලධාරීන් 1,142 ක් වී තිබුණි. එම නිලධාරීන් විසින් සිදු කරනු ලබන කාර්යයන් සම්බන්ධයෙන් නිසි පසුවිපරම් කිරීමක් හා අධීක්ෂණයන් සිදු කර නොතිබුණු අතර එවා තිබුණු ප්‍රගති වාර්තාවලින්ද ප්‍රමාණවත් කරුණු දැක්වීම් සිදු කර නොතිබුණි.

**(ආ)** අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන් 04 ක් සහ තෘතියික මට්ටමේ නිලධාරීන් 04 දෙනෙකුගේ පුරප්පාඩු පැවතිම නිසා ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් සිදු කරනු ලබන අමාත්‍යාංශ කාර්යයන්, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව, ජාතික ළමා ආරක්ෂක අධිකාරිය, ළමා සංවර්ධන අරමුදල, ළමා ලේකම් කාර්යාලය, කාන්තා කාර්යාංශය, කාන්තා කමිටුව, සංවර්ධන අංශය ආදියේ කටයුතු සම්බන්ධයෙන් අධීක්ෂණ කටයුතු නිසි පරිදි සිදු කිරීමට නොහැකි වී තිබුණි.